ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලය - 2016

-----------------------------------------------------------------

ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනතේ 14 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර ආයතනයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

-----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (**ISSAI** 1000 – 1810 ) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාලවන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත්වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.4 **තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**---------------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2.** **මූල්‍ය ප්‍රකාශන**

**---------------**

**2.1** **තත්ත්වාගණනය කළ මතය**

**-----------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2** **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**------------------------------------------**

**2.2.1** **ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති**

**---------------------------------------**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 07

**-----------------------------------------------**

ප්‍රමිතයේ **86 (ඇ)** ඡේදය ප්‍රකාරව ගොඩනැගිලි හා වාහන ක්ෂය කිරීම සඳහා භාවිතා කළ ක්ෂය අනුපාතිකයන් හෙළිදරව් කර නොතිබුණි**.**

**(ආ)** ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 09

-----------------------------------------------

ප්‍රමිතයේ 09 ඡේදයට පටහැනි ලෙස පිරිවැය රු.3,481,290 ක් වූ හානි වූ තොග මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගයට ඇතුලත් කර තිබුණි.

**2.2.2** **ගිණුම්කරණ අඩුපාඩු**

------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) වර්ෂය තුළ මුදල් ගලාඒම සහ මුදල් ගලායාම පිළිබිඹු වන පරිදි ක්‍රියාකාරකම් හඳුනාගෙන මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කර නොතිබුණ අතර, ඉදිරිපත් කරන ලද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පහත අඩුපාඩු පැවතුණි.

**(i)** මෙහෙයුම් ලාභය ගණනය කිරීම සඳහා ගැලපුම් කිරීමේදී සේවක පාරිතෝෂික සඳහා ප්‍රතිපාදනය රු.371,989 කින් අඩුවෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.569,140 ක් වූ පාරිතෝෂික ගෙවීම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දක්වා නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ රු.31,641 ක් වූ ඉතුරුම් පොළිය නැවත ආයෝජනය කිරීම ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහය යටතේ දක්වා නොතිබුණි.

(iii) ඉකුත් වර්ෂ වලට අදාල ගොවි ණය කපා හැරීම් රු.80,610 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ දෙවරක් සටහන් කර තිබුණි.

(ආ) ප්‍රත්‍යාගණන වාර්තාව අනුව තාවකාලික ගොඩනැගිලි වල ඵලදායී ජීවිත කාලය වර්ෂ10 ක් ලෙස දක්වා තිබුණු අතර ක්ෂය කිරීමේ දී වර්ෂ 19 ක් ලෙස සලකා ක්ෂය කිරීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ දී ක්ෂය ප්‍රමාණය රු. 100,799 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගය රු.1,938,769 කින් වැඩියෙන් දක්වා තිබුණි.

## 2.3 ලැබියයුතු හා ගෙවියයුතු ගිණුම්

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) හිටපු නිලධාරියෙකු විසින් 2011 වර්ෂයේදී ණය පදනම මත රු. 64,500 ක් වටිනා සුවපෝෂ හා මව්පෝෂ පැකට් ලබා ගෙන තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විටද එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2011 වර්ෂයේ සිට වී අලෙවි මණ්ඩලයට ගෙවිය යුතු වියදමක් ලෙස ගිණුම් වල රු. 3,300,000 ක් දක්වා තිබුණද වී අලෙවි මණ්ඩලයේ ගිණුම් අනුව එවැනි ලැබිය යුතු මුදලක් මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඇ) 2011, 2012 හා 2013 වර්ෂවල සිට පැවත එන ණයගැති ශේෂවල එකතුව රු. 878,842 ක් වූ අතර එම මුදල් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වර්ෂ 2 ත් 5 ත් අතර කාලයක සිට පැවත එන ණයහිමි ශේෂවල එකතුව රු. 390,560 ක් හා වර්ෂ 5 කට වඩා වැඩි කාලයක සිට පැවත එන ණයහිමි ශේෂවල එකතුව රු. 199,757 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මණ්ඩලය විසින් ගොවිහාර අරමුදලින් 2010 වර්ෂයේ සිට 2015 වර්ෂය දක්වා අවස්ථා 3 කදී ලබා ගන්නා ලද රු. 5,500,000 ක් වූ ණය මුදල 2016 වර්ෂය තුල ගෙවා අවසන් කළ යුතු නමුත් සමාලෝචිත වර්ෂය අවසානය වන විටත් රු.4,900,000 ක් ගෙවිය යුතුව පැවතුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්.

-----------------------------------------------------------------------------

පහත සඳහන් නීති රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම් අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසි යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (අ) මුදල් රෙගුලාසි 177 (1) හා 371 | එකතු කරගන්නා මුදල් දිනපතා බැංකු ගත කළ යුතු වුවද දෙහිවල අලෙවි සැලෙහි හා නාරාහේන්පිට පැළ තවානේ එකතු කරගත් මුදල් දින 6 ත් 12 ත් අතර කාලයක් ප්‍රමාද වී බැංකු ගත කළ අවස්ථා නිරීක්ෂණය විය. තවද දෙහිවල අලෙවි සැලේ අනුමත සුළු මුදල් අග්‍රිමය රු.70,000 ක් වුවද එම මුදල ඉක්මවා රු.131,092 සිට රු. 271,946 ක් අතර මුදලක් අත රඳවා ගෙන තිබුණි. |
| (ආ) මුදල් රෙගුලාසි අංක 751(1) | දෙහිවල අලෙවි සැල බඩු ලේඛන හා තොග පොත් පවත්වා ගෙන ගොස් නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මූල්‍ය ප්‍රතිඵලය රු 2,343,342 ක ඌනතාවයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 13,925,060 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.11,581,718 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ දී ප්‍රවාහන, සන්නිවේදන, උපයෝගිතා සහ වෙනත් සේවා වියදම රු.17,608,143 කින් වැඩි වුවද භාණ්ඩාගාරයෙන් හා කෘෂිකර්ම අමාත්‍යාංශයෙන් ලද ප්‍රතිපාදන රු.22,391,535 කින් වැඩිවීම හා අනෙකුත් ආදායම් රු.9,018,043 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයේ වර්ධනය කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂයේ හා ඉකුත් වර්ෂ හතරක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේ දී මූල්‍ය ප්‍රතිඵලයේ 2014 වර්ෂයේ අතිරික්තයක් හා 2012, 2013, 2015 හා 2016 වර්ෂවල ඌනතාවයන්ද පැවතුණි. සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය වීම් සැලකිල්ලට ගැනීමේ දී 2012 වර්ෂයේ දී රු.17,768,473 ක් වූ දායකත්වය සමාලෝචිත වර්ෂයේ දී රු. 37,019,044 ක් විය.

### 3.2 මණ්ඩලයට එරෙහිව ආරම්භ කර ඇති නෛතික සිද්ධි

අධ්‍යක්ෂක මණ්ඩල අනුමැතියකින් තොරව මණ්ඩලයට නීත්‍යානුකූල අයිතියක් නොමැති ඉඩමක 2012 වර්ෂයේදී වැටක් ඉදිකිරීම සඳහා ගිවිසගත් වටිනාකමකින් තොරව හා ප්‍රසම්පාදන පරිපාටියෙන් බැහැරව කොන්ත්‍රාත්තුවක් පිරිනමා තිබූ අතර කොන්ත්‍රාත්කරුට මුදල් නොගෙවීම හේතුවෙන් රු. 3,209,728 ක වන්දි මුදලක් ඉල්ලා ඔහු විසින් පැවරූ නඩුව සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අවසන් වී නොතිබුණි.

**3.3 වෙනත් රාජ්‍ය ආයතනවල සම්පත් උපයෝජනය කිරීම**

---

කෘෂිකර්ම අමාත්‍යාංශයට අයත් වාහන 03 ක් ද, ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයට අයත් ට්‍රැක්ටර් 03 ක් ද, මහවැලි අධිකාරියට අයත් වාහනයක් ද, සුළු අපනයන භෝග ප්‍රවර්ධන මණ්ඩලයට අයත් වාහනයක්ද මණ්ඩලයට පවරා ගැනීමට කටයුතු නොකර උපයෝජනය කරන බව නිරීක්ෂණය විය.

**4. මෙහෙයුම් සමාලෝචනය**

---

**4.1 කාර්යසාධනය**

---

1973 අංක 15 දරන ශ්‍රී ලංකා ජාතික සාගිනි නිවීමේ ව්‍යාපාර මණ්ඩල පනත ප්‍රකාරව, සමාජීය හා ආර්ථික සංවර්ධනය සඳහා ආණ්ඩුවේ නොවූ විදේශීය හා දේශීය නියෝජ්‍යත්වවල ආධාර ලබා ගැනීම, සංවර්ධන යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේදී ආයතනවලට හා වෙනත් මණ්ඩලවලට සහාය වීම, කෘෂිකාර්මික හා කාර්මික සංවර්ධනයට යොමු වූ යෝජනා ක්‍රමවලට ආධාර කිරීම, දියුණු කිරීම හා සම්බන්ධීකරණය කිරීම හා ක්‍රියාත්මක කිරීමෙහිලා ආණ්ඩුවේ නොවූ නියෝජ්‍යත්ව උනන්දු කිරීම, ජාත්‍යන්තර සාගිනි නිවීමේ ව්‍යාපාර වෙනත් සමාන පිටරට ආයතන සමග සහයෝගී වීම මණ්ඩලයේ අරමුණු වේ.

(අ) යථෝක්ත අරමුණු ඉටුකර ගැනීම වෙනුවෙන් මණ්ඩලය විසින් සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කරන ලද ක්‍රියාකාරී සැලැස්මට අනුව රු.මිලියන 617.91 ක් වැය කර ව්‍යාපෘති 12 ක් ක්‍රියාත්මක කිරීම සඳහා ඇස්තමේන්තු සකස් කර තිබුණ ද සමාලෝචිත වර්ෂයේ එම ව්‍යාපෘති කිසිවක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) මණ්ඩලයේ අරමුදල්වලින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති 12කින් සමාලෝචිත වර්ෂයේ දී රු. මිලියන 274 ක ඉපයීමක් අපේක්ෂා කර තිබුණ ද සමාලෝචිත වර්ෂය තුල දී උපයා ඇති ආදායම රු.මිලියන 75 ක් පමණක් විය. ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිවල කාර්යසාධනය පහත පරිදි විය.

**(i)** <u>තණමල්විල ගොවිපොළ</u>

අක්කර 16 කින් සමන්විත වූ මෙම ගොවිපොල තුල කිසිදු වගා කටයුත්තක් සිදුකර නොතිබුණ අතර සමාලෝචිත වර්ෂයේදී බදු කුලී ආදායම වශයෙන් රු.128,000 ක් උපයාගෙන තිබූ අතර මුළු වියදම රු. 655,412 ක් විය.

**(ii)** <u>බුත්තල කොම්පෝස්ට් පොහොර ව්‍යාපෘතිය</u>

අක්කර 10 කින් සමන්විත මෙම ඉඩමේ කොම්පෝස්ට් පොහොර සකසා අලෙවි කිරීම සිදු කරනු ලබන අතර සමාලෝචිත වර්ෂය තුල නිෂ්පාදනය කළ ප්‍රමාණය කිලෝග්‍රෑම් 87,650 ක් විය. කෙසේ වුවද මෙම නිෂ්පාදන සඳහා ප්‍රමිති සහතිකයක් ලබාගෙන නොතිබුණි.

**(iii)** <u>දෙහිවල පාරිභෝගික ද්‍රව්‍ය අලෙවි සැල</u>

දෙහිවල අලෙවි සැලේ ලාභය පෙර වර්ෂයට වඩා සියයට 83 කින් අඩු වී තිබුණි. විකුණුම් ආදායම රු. 2,005,531 කින් අඩුවීම සහ වර්ෂය තුල පොදුකාර්ය වියදම රු.424,755 කින් වැඩිවීම මෙයට හේතු වී තිබුණි.

**(iv)** <u>හෙල්දි ෆුඩ් භෝජනාගාරය</u>

- වසවිස වලින් තොර පාරම්පරික දේශීය ආහාර පරිභෝජන රටාවක් ඇති කිරීමේ අරමුණින් නාරහේන්පිට ප්‍රදේශයේ ආරම්භ කරන ලද හෙල්දි ෆුඩ් භෝජනාගාරයේ එවැනි ආහාර අලෙවි කිරීමක් කර නොතිබුණි. එහි ආදායම් හා වියදම් තත්ත්වය සැලකීමේදී 2012 වර්ෂයේදී රු. 406,765 ක් වූ අලාභය ක්‍රමයෙන් වැඩි වී 2015 වර්ෂයේදී රු.4,192,533 ක්වූ අතර 2016 වර්ෂයේදී රු.3,812,515 ක් විය.

- මෙම භෝජනාගාරයේ සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාව අනුව මිල දී ගෙන තිබූ ද්‍රව්‍ය හා පිළියෙල කරන ලද ආහාර අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය විය. විස්තර පහත දැක්වේ.

| ද්‍රව්‍ය | ප්‍රමාණය | සැකසිය හැකි ආහාර (පැකට් ගණන) | සකසා තිබූ ආහාර (පැකට් ගණන) | විචලනය |
|---|---|---|---|---|
| | කි.ග්‍රෑ | | | |
| හාල් | 1762 | 10,551 | 7,233 | 3,318 |
| මාළු | 210 | 5,215 | 1,945 | 3,270 |
| මස් | 188 | 2,774 | 1,046 | 1,728 |

**(v)** <u>නාරාහේන්පිට පැළ තවාන</u>

මෙම පැළ තවානේ ආදායමෙන් වැඩි ප්‍රතිශතයක් පැළ වර්ග අලෙවි කිරීමෙන් ලබා ගන්නා අතර 2016 අගෝස්තු 08 දින සිදු කරන ලද භෞතික විගණන පරීක්ෂාවේ දී පැළ වර්ග හයක භෞතික ශේෂය හා තොග ලේඛනයේ ශේෂය අතර වටිනාකම රු.14,425 ක් වූ පැල 102 ක ඌනතාවයක් පැවතුණි.

**(vi)** <u>සහල්පිටි ප්‍රවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය - කලංකුට්ටිය</u>

සමාලෝචිත වර්ෂය තුල මෙම ව්‍යාපෘතිය රු.226,394 ක අලාභයක් ලබා තිබූ අතර මුළු පිරිවැයෙන් සියයට 83 ක් වැටුප් දීමනා සඳහා වැයකර තිබුණි.

4.2 **කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලයේ පනත සඳහා සංශෝධන ඉදිරිපත් කරන ලෙස 2012 ඔක්තෝබර් 01 දින පැවැත්වූ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව නියෝගයක් ලබා දී තිබූ අතර එම නියෝගය මෙතෙක් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේදී නාරාහේන්පිට අලෙවිසැලේ සිදු වී තිබූ රු. 77,352 ක මුදල් සොරකම සම්බන්ධයෙන් චෝදනා පත්‍ර කෙටුම්පත හා මූලික විමර්ශන වාර්තා

2015 මැයි 5 දින ලබා දී තිබුණද විගණිත දිනය වූ 2017 මැයි 25 දින වන විටත් මේ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල දී හෙල්දි ෆුඩ් භෝජනාගාරයේ සිදු වූ රු.73,415 ක වංචාව සම්බන්ධයෙන් 2016 ජූලි 28 දින කෘෂිකර්ම අමාත්‍යාංශයේ පරීක්ෂණ මණ්ඩලයක් විසින් සිදු කල මූලික විමර්ශනය අනුව එම මුදල අදාල සේවකයින්ගෙන් අයකරගන්නා ලෙස නිර්දේශ කර තිබුණ ද 2017 මැයි 25 දින දක්වාම එම මුදල අයකර ගෙන නොතිබුණි.

4.3 **ආර්ථික නොවූ ගනුදෙනු**

----------------------------

කොළඹ පවත්වන ලද වස විස නැති ජාතික පොළ ප්‍රදර්ශනය සඳහා නාමපුවරු, තොරතුරු පුවරු, ලෝගෝ සහ ප්‍රදර්ශන වියදම් ලෙස රු.486,110 ක් මණ්ඩලය විසින් වැය කර තිබුණි. එම ප්‍රදර්ශනය සඳහා භාවිතා කළ නාමපුවරු, තොරතුරු පුවරු සහ ප්‍රදර්ශන පුවරු අම්පාර දිස්ත්‍රික්කයේ පැවත් වූ දෙවන ප්‍රදර්ශනය සඳහා යොදා ගැනීමේ හැකියාව තිබියදී ඒ වෙනුවෙන් නැවත රු.**550,000** ක වියදමක් දරා තිබුණි.

**4.4** **මතභේදයට තුඩුදෙන ගනුදෙනු**

------------------------------------

මණ්ඩලයේ අරමුණින් බැහැරව පොහොර සහනාධාර මුදල් ප්‍රදානය කිරීමේ ජාතික වැඩසටහන සඳහා" ගොවිතැනට හරි මඟක්" යන තේමාව යටතේ පුවත්පත් දැන්වීම් 7 ක් සහ රූපවාහිනී වැඩසටහන සජීවී විකාශනය සඳහා රු.1,878,318 ක් ද "ගම් දොර" වැඩසටහනට අදාල මාධ්‍ය ප්‍රචාරණය වෙනුවෙන් පුවත්පත් 8 ක දැන්වීම් පලකිරීම සඳහා රු.2,543,200 ක් ද වැයකර තිබුණි.

**4.5** **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) දෙහිවල අලෙවි සැලෙහි බේකරියක් පවත්වාගෙන යාම සඳහා 2012 වර්ෂයේ මිලදීගෙන තිබූ රු.452,000 ක් වටිනා යන්ත්‍ර 2 ක් භාවිතයට නොගෙන ගබඩාවේ නිෂ්ක්‍රීයව පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට ඉතිරි කිරීමේ ගිණුම් 03 ක පවතින රු.806,008 ක මුදල ඵලදායී ආයෝජන මාර්ගයක ආයෝජනය කිරීම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණි.

**4.6** **කාර්ය මණ්ඩල පරිපාලනය**

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අනුමත කාර්ය මණ්ඩලය 28 ක් වුව ද, 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාර සේවකයින් 43 ක් බඳවා ගැනීම් හේතුවෙන් තථ්‍ය කාර්ය මණ්ඩලය 71 ක් වූයෙන් අතිරික්ත සේවක සංඛ්‍යාව සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) ඉහත චක්‍රලේඛයේ 7 වන ඡේදය ප්‍රකාරව 2014 නොවැම්බර් 12 න් පසුව තාවකාලික, අනියම්, ආදේශක කොන්ත්‍රාත් පදනම මත සේවකයින් බඳවා ගත යුත්තේ කළමනාකරණ

සේවා දෙපාර්තමේන්තුවේ පූර්ව අනුමැතියෙන් පසුව වුවද මීට පටහැනිව කොන්ත්‍රාත් සහ දෛනික වැටුප් ගෙවීමේ පදනමින් සේවකයින් 04 දෙනෙකු බඳවා ගෙන තිබුණි.

(ඈ) නියෝජ්‍ය අධ්‍යක්ෂක තනතුර උසස් කිරීමේ ශ්‍රේණියක් ලෙස බඳවාගත යුතු බව කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව අනුමත කර තිබුණද , සමාලෝචිත වර්ෂය තුළ නියෝජ්‍ය අධ්‍යක්ෂක (සංවර්ධන) බාහිරින් බඳවා ගැනීම සඳහා රු.43,412 ක මුදලක් වැයකර පුවත්පත් දැන්වීමක් පලකර සම්මුඛ පරීක්ෂණයක් ද පවත්වා තිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

------------------------------------------

### 5.1 අයවැය ලේඛනමය පාලනය

-----------------------------

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත ආදායම් සහ වියදම්, තථ්‍ය ආදායම් සහ වියදම් සමඟ සැසඳීමේදී සියයට 15 සිට 98 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

### 5.2 ප්‍රසම්පාදන සැලැස්ම

------------------------

ප්‍රසම්පාදන සැලැස්මේ ඇතුළත් අයිතම 5 ක් සඳහා රු,26,117,000 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද මිලදී ගැනීම් සිදුකර නොතිබුණු අතර අයිතම 3 ක් සඳහා රු,3,310,000 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබුණද රු,878,860 ක මිලදී ගැනීම් පමණක් සිදුකර තිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

----------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | අයවැයගත වියදම් හා තථ්‍ය වියදම් අතර විචලනයන් අනාවරණය වීම හා ණය නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) වත්කම් පාලනය | වාහන විධිමත් ලෙස පවරා ගෙන නොතිබීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | චක්‍රලේඛ විධිවිධාන වලට අනුකූල නොවන ලෙස බඳවා ගැනීම. |
| (ඈ) ව්‍යාපෘති කළමනාකරණය | ක්‍රියාකාරී සැලැස්මෙහි සඳහන් පරිදි ව්‍යාපෘති ක්‍රියාත්මක නොකිරීම සහ දිගින් දිගට ක්‍රියාත්මක වන ව්‍යාපෘති අලාභ ලැබීම. |